CPA
Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

2019 ජූලි මස 02 වන දින,

ප්‍රිය මැතිතුමණි/මැතිණියනි,

**මරණ දඬුවම පැමිණවීම ක්‍රියාත්මක වීම වැළැක්වීම සඳහා වන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන්හි අවශ්‍යතාවය**

වර්තමානයේ මරණ දඬුවමට නියමව සිටින සිරකරුවන් හතරදෙනෙකුගේ මරණ වරෙන්තුව තමා විසින් අත්සන් කළ බවට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් 2019 ජුනි මස 26 වන දින ප්‍රකාශ කිරීමට යෙදිනි. එම පුද්ගලයන් හතර දෙනාගේ අනන්‍යතාවය පිළිබඳව වන විස්තර කිසිවක් ප්‍රසිද්ධ කරනු ලැබ නොමැත. 1976 සිට ශ්‍රී ලංකාවේ මරණ දඬුවම ක්‍රියාත්මක කර නොමැති අතර දැනට වසර 43ක් තිස්සේ තාවකාලික නැවැත්වීමක් (Moratorium) ක්‍රියාත්මක වේ.

2007 වසරේ සිට එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් "මරණ දඬුවම අහෝසි කිරීම අරමුණු කොට ගෙන මරණ දඬුවම් පැමිණවීම තාවකාලිකව නැවැත්වීමක්" ස්ථාපිත කිරීම සඳහා යෝජනාවන් හතක් සම්මත කොටගෙන තිබේ. ඉතාම මෑතකදී එනම් 2018 දෙසැම්බර් මස යෝජනාව ඇතුළුව එම යෝජනාවන්ගෙන් පහකට පක්ෂව ශ්‍රී ලංකාව ඡන්දය පාවිච්චි කොට තිබේ. එබැවින් මරණ දඬුවම් පැමිණවීම නැවත ඇරඹීම වසර ගණනක් තිස්සේ ශ්‍රී ලංකාව විසින් ජාත්‍යන්තර පොදු වේදිකාවන්හි දී ගනු ලැබ  ඇති ස්ථාවරයට එරෙහිව යාමක් වනු ඇත. තමන්ට අදාළ සන්දර්භයන්හි දී බහුතරයක් රටවල් විසින් මරණ දඬුවම අහෝසි කොට ඇති තත්ත්වයකදී සහ ලෝක මට්ටමින් මරණ දඬුවම් පැමිණවීම් අඩුවී ඇති පසුබිමකදී මෙය සිදුවන බවද මෙහිදී අවධාරණය කළයුතු වෙයි. එබැවින් මරණ දඬුවම නැවත ගෙන ඒම ලෝක මානව හිමිකම් ප්‍රවණතාවයට ද එරෙහි වූවක් බව කිව යුතුය. වැඩිදුරටත් කිවයුතු වන්නේ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ 6(2) වගන්තියට අනුව මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි "වඩාත්ම බරපතල අපරාධයන්" ලෙස නොසැලකෙන බව දැන් තහවුරු වී ඇති බවයි.

ප්‍රායෝගික තලයෙහිදී මරණ දඬුවම අපරාධයන් වළක්වන සාධකයක් බව පෙන්වීමට සාක්ෂි නොමැත. දණ්ඩන මුක්තිය, දූෂණය හා අපරාධ යුක්තියෙහි වූ ගැටළු යනාදිය පුළුල්ව පැතිර පවත්නා ශ්‍රී ලංකාව වැනි රටක, අධිකරණය මගින් යුක්තිය ඉටුනොවීමේ ශක්‍යතාවය ද සමඟ අහිංසක පුද්ගලයකු වරදකරුවෙකු වීමේ ඉඩකඩ බෙහෙවින්ම වැඩිවන බව සැලකිල්ලට ගත යුතුම  වෙයි. ඔබ දන්නා පරිදි මරණ දඬුවම පැමිණවීම නැවත නිවැරදි කළ නොහැකි දඬුවමක් වන අතර අධිකරණය මගින් නිසි ලෙස යුක්තිය ඉටුනොවීමක් සිදුවන විටකදී එය කෲර, අමානුෂික සහ අවමන්සහගත දඬුවමක් සහ නැවත ප්‍රකෘතිමත් කළ නොහැකි හානියක් බවට පත්වනු ඇත.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙසේ ඔබට ලියන්නේ පවතින සියලු ව්‍යවස්ථාවන් වෙතින් මරණ දඬුවම අහෝසි කිරීමේ අවශ්‍යතාවය ඇතුළු ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති පද්ධතියෙහි හදිසි ව්‍යවස්ථා සංශෝධනයන් සිදුකිරීමට අවශ්‍යව පවත්නා සන්දර්භයෙහිදීය. එවැනි පියවරකින් අධිකරණයෙන් යුක්තිය ඉටුවීම සිදුනොවන බවටත් ජීවිතය සහ මරණය පිළිබඳව වන තීන්දු ගැනීමේ බලය, එක් තනි පුද්ගලයෙකු හට නොලැබෙන බවටත් සහතික කරනු ලබනු ඇත. ජනතා නියෝජිතයෙකු වන ඔබගෙන් අපි ඉල්ලා සිටින්නේ මෙම තීරණාත්මක පියවර ගැනීම මගින් පුද්ගලයෙකුගේ ජීවිතය අහිමිකිරීම දක්වා ගමන් කළ හැකි, නැවත ප්‍රකෘතිමත් කළ නොහැකි හා අවලංගු කළ නොහැකි මෙම පියවර ගැනීම වළක්වාලන ලෙසය. එමෙන්ම අපරාධ යුක්ති පද්ධතියෙහි ප්‍රමාදයන් හට ආමන්ත්‍රණය කරන ප්‍රතිසංස්කරණයන් සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයන් හඳුන්වාදීම ඇතුළු අපරාධ යුක්තියේ ප්‍රතිසංස්කරණයන් ඇරඹීමේ හදිසි අවශ්‍යතාවය පිළිබඳව සොයා බලා කටයුතු කරන ලෙසද අපි ඔබගෙන් ඉල්ලා සිටීමට කැමැත්තෙමු. මෙම ගැටළු අතරින් සමහරක් පිළිබඳව නීති කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ පාර්ලිමේන්තු ආංශික කමිටුව මෙන්ම වෙනත් මුලපිරීම් මගින් ද දැනටමත් විමසා බලනු ලැබ ඇත. මේ පිළිබඳව වැඩිදුර තොරතුරු අවශ්‍ය වන්නේ නම් ඊට සහායවීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට හැකි අතර මේ සම්බන්ධයෙන් ඔබ සමග එක්ව කටයුතු කිරීමට අපි උනන්දුවෙන් බලාපොරොත්තුව සිටිමු.

ඔබට ස්තුතියි,

ආචාර්යය පාක්‍යසෝති සරවනමුත්තු - විධායක අධ්‍යක්ෂක